# දේශ විමුක්ති ජනතා පක්ෂය
# ව්‍යවස්ථාව

1. නම : දේශ විමුක්ති ජනතා පක්ෂය

2. අරමුණ : ලාංකීය ගොවි කම්කරු ජනතාවගේ විප්ලවීය මඟ පෙන්වන්නා දේශ විමුක්ති ජනතා පක්ෂයයි. සමාජවාදය හා කොමියුනිස්ට් වාදය මගින් නිර්ධන පංති ආඥාදායක රාජ්‍යයක් ගොඩනැගීම මෙහි අරමුණයි. මාක්ස් ලෙනින්වාදී මඟ පෙන්වීම යටතේ පක්ෂයේ සියලු කාර්යයන් කෙරෙන අතර, මිනිසා විසින් මිනිසා සූරාකෑමෙන් සම්පූර්ණයෙන්ම මුදවා ගැනීමේ නිවැරදි මඟ පෙන්වා දෙනු ලබයි. සියළු නිර්ධනීන් එක් ධජයක් යටතේ එක් සේසත් කිරීම මෙහි ලා ප්‍රධාන අරමුණකි.

3. ධජය : දෑකැත්ත මිටිය මැද සිටින සේ රතු ධජය ඔස්සේ දිග පලල මෙන් $1\,^1/_2$ ක් විය යුතුය.

4. සාමාජිකත්වය :

I. සුදුසුකම් : අවු: 18ට නොඅඩුව පක්ෂ ප්‍රතිපත්ති පිළිගන්නා පක්ෂයේ සංවිධානයක වැඩ කිරීමට එකඟවන, නියම කරන ලද සාමාජික මුදල් ගෙවන හා පක්ෂයේ තීරණ ක්‍රියාත්මක කිරීමට බැඳී සිටින අය.

II. සාමාජියින් බඳවා ගැනීමේ පිළිවෙත :

(අ) දේශපාලන කමිටුවේ සාමාජිකයෙකු විසින් යෝජනා කරන ලදුව, එහි ඒකමතිකත්වය අනුව.

III. සාමාජික වර්ගීකරණය :

(අ) අපේක්ෂක සාමාජිකත්වය කාලය අවුරුදු 1 කි.

(ආ) පූර්ණ සාමාජිකත්වය - එක් අවුරුදු කාලයකින් පසු දේශපාලන මණ්ඩලයේ අනුමැතිය ලැබිය යුතුයි. අපේක්ෂක සාමාජිකත්වයෙන් තොරව විශේෂ අවස්ථා සලකා බලා දේශපාලන මණ්ඩලයේ ඒකමතිකත්වය මත සාමාජිකත්වය පිරිනැමිය හැක.

IV. සාමාජික අයිතිවාසිකම් හා සුදුසුකම්:-

අපේක්ෂිත සාමාජිකයින්ට සාමාන්‍ය යුතුකම් හා අයිතිවාසිකම් තිබුනද, පක්ෂයේ නිලයකට පත් කිරීමේ අයිතිය, පත්වීමේ අයිතිය හා දේශපාලන යොජනාවලදී ඡන්දය දීමේ අයිතිය නොමැත.

5. **සාමාජික ලේඛණ සහ වාර්තා :**

දේශපාලන කමිටුව භාරයේ සියළුම සාමාජික ලේඛණ පවත්වාගෙන යනු ලැබේ.

6. **සාමාජික මුදල් :**

සෑම සාමාජිකයෙකුම දේශපාලන කමිටුව තීරණය කරණ මාසික දායකත්වයන් ගෙවිය යුතුය. මීට අමතරව සාමාජික ආදායම පදනම් වූ ගෙවීමක් තීරණය කිරීමටද දේශපාලන මණ්ඩලයට බලය ඇත.

7. **සාමාජික කාර්යභාරය :**

I. පක්ෂ සංවිධානයේ කාරයයන්ට නියමිත අයුරින් සහභාගි විය යුතු අතර, එජස ප්‍රතිපත්ති, තීරණ හා නියෝග පිළිපැදීමට පක්ෂපාතී විය යුතුය.

II. මාක්ස් ලෙනින් වාදය අධ්‍යයනය කළ යුතු අතර එය තමාගේ දැනීමේ තරමට වර්ධනය කිරීමට උත්සාහ ගත යුතුය.

III. පක්ෂ ප්‍රකාශන, සඟරා පුවත්පත්, ආදිය කියවීම හා ජනප්‍රිය කරවීම.

IV. පක්ෂ විනය හා පක්ෂ ව්‍යවස්ථාව මැනවින් නිරීක්ෂණය කළ යුතුය.

V. වෙසෙසින්ම ජනතාව හා පක්ෂය ප්‍රමුඛත්වයෙහි ලා කටයුතු කළ යුතුය.

VI. ජනතාව වෙනුවෙන් තම කාර්යය ඉටු කලයුතු අතර, ජනතා සිතුම් පැතුම් මැනවින් දැන එය පක්ෂය වෙත දැන්විය යුතුය.

VII. විවේචන හා ස්වයංවිවේචන විධි ක්‍රමය ඉවහල් කරගත යුතුය.

VIII. පක්ෂයට අවංකව විශ්වාසවන්තව හා සත්‍යවන්තව කටයුතු කල යුතු අතර පක්ෂයේ රහස් ආරක්ෂා කල යුතුය.

IX. පක්ෂ එක්සත් භාවය ආරක්ෂා කලයුතු අතර, රටේ ජනතාවගේ සතුරන් පිළිබඳ මනා අවධානයකින් සිටිය යුතුය.

X. සතුරු චෝදනාවන්ගෙන් හා අවලාදයන්ගෙන් පක්ෂයත්, ජනතාවත්, ආරක්ෂා කල යුතුය.

8. සාමාජික අයිතිවාසිකම් :

I. පක්ෂ සංවිධානයට හා කමිටුවල පත්වීම හා පත් කිරීම.

II. පක්ෂ සාකච්ඡාවලට සහභාගි වීම හා පක්ෂ ප්‍රතිපත්ති හා තීරණවලට තමාගේ දායකත්වය ලබා දීම.

III. පක්ෂයට යෝජනා ඉදිරිපත් කිරීම.

IV. පක්ෂ රැස්වීම් වලදී පක්ෂය හා පක්ෂ කමිටු විවේචනය කිරීම.

V. පක්ෂ කටයුතු පිටස්තරව කථා කල අය වෙනුවෙන් විනයානුකූලව කටයුතු කිරීම.

VI. තමන් පක්ෂයේ යමකට එකඟ නොවූ විට එය ඊළඟ කමිටුවට ඉදිරිපත් කල හැක. කිසියම් දේශපාලන මතයක් වේනම් එය දේශපාලන මණ්ඩලය දක්වා ඉදිරිපත් කල හැක. එවැනි අවස්ථාවකදී තම මතය පක්ෂ සහෝදරාත්මක තීරණයකින් අවසන් කල යුතුය.

VII. කිසියම් අභියාචනයක් හෝ චෝදනාවක් වේ නම් එය මධ්‍ය මණ්ඩලය දක්වා ඉදිරිපත් කළ හැක.

9. **සාමාජිකත්වයෙන් ඉවත්වීම හා ඉවත් කිරීම :**

(අ) ඉවත් කිරීම :

I. පක්ෂ සාමාජික සුදුසුකම් උල්ලංඝනය කිරීම.

II. විනය හේතු මත.

III. ඉවත් කිරීම පිළිබද අවසාන තීරණය ගනු ලබන්නේ දේශපාලන මණ්ඩලය මගිනි.

(ආ) ඉවත් වීම :

I. ඉවත් වීමට අයදුම් කලයුත්තේ දේශපාලන කමිටුවය. අයදුම ප්‍රතික්ෂේප කිරීමට දේශපාලන මණ්ඩලයට බලය ඇත. ඉවත් වීමේදී හා ඉවත් කිරීමේදී අදාල වන සිද්ධිය පක්ෂය කෙරෙහි බරපතල ලෙස බලපාන්නේ නම් සාමාජිකයා පක්ෂයෙන් නෙරපීමට හා අවශ්‍ය වන්නේ නම් එය ප්‍රසිද්ධියට පත් කිරීම දේශපාලන මණ්ඩලයට අයත් කාර්යයකි.

10. **මධ්‍යගත ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියා පිළිවෙත :**

පක්ෂ ව්‍යුහය මධ්‍යගත ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම යටතේ පදනම් කර ඇත. මධ්‍යගත ප්‍රජාතන්ත්‍රවාදය යනු පක්ෂ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය මධ්‍යගත නායකත්වය මූලික කොට එකී නායකත්ව යටතේ මග පෙන්වීමයි.

I. සියලු පක්ෂ සංවිධාන ඉහළ සිට පහළ දක්වා ඡන්දයෙන් පත්විය යුතුය.

II. සුලුතරය බහුතරයේ තීරණ ක්‍රියාත්මක කළ යුතුය. ඉහළ නියෝග පහළ සංවිධාන පිළිපැදිය යුතුයි. සියලු පක්ෂ සංවිධාන පක්ෂ සම්මේලනයේ සහ මධ්‍ය මණ්ඩලයේ තීරණ හා නියෝග ක්‍රියාත්මක කල යුතුයි.

III. සියලු පක්ෂ කමිටු සිය ප්‍රගති වාර්ථා ඊළඟ කමිටුවට නියමිත දිනයට ඉදිරිපත් කළ යුතුය.

IV. ඉහලම කමිටුව දක්වා පක්ෂයේ පහළ සාමාජිකයන්ගේ අදහස් හා විවේචන සළකා බැලිය යුතුය.

V. සියලු පක්ෂ ක්‍රියාත්මක වීම සාමූහික තීරණයන්ට අනුකූල විය යුතුය.

11. **පක්ෂ සම්මේලන වාරයන් :**

(අ) I. දේශපාලන කමිටුව මගින් අවු. 03කට වරක් පක්ෂ සම්මේලනය පවත්වනු ලැබේ.

II. අති විශේෂ සම්මේලන වාරයක් පැවැත්වීමට කැඳවීමට දේශපාලන මණ්ඩලයට බලය ඇත

III. සම්මේලන පැවැත්වීමේ දිනය හා ස්ථානය තීරණය කිරීමේ බලතල දේශපාලන මණ්ඩලයට පැවරේ

IV. පක්ෂයේ පූර්ණ හා අපේක්ෂක සාමාජිකත්වයට සම්මේලනයට සහභාගි වීමට අයිතිය ලැබේ.

12. **පක්ෂ සම්මේලනයට පැවරෙන කාර්ය භාරය :**

I. දේශපාලන කමිටුවට ඉදිරිපත් කරණ දේශපාලන වාර්ථාව අනුමත කිරීම.

II. දේශපාලන කමිටුව ඉදිරිපත් කරන සංවිධාන වාර්ථාව සාකච්ඡාවට භාජනය කර අනුමත කිරීම.

III. පක්ෂ ප්‍රතිපත්ති මාලාව හෝ පක්ෂ ව්‍යවස්ථාව අවශ්‍ය වේ නම් සංශෝධනය කිරීම.

IV. කාලීන දේශපාලන ස්ථාවරය නිශ්චය කිරීම.

V. රහස් ඡන්දයෙන් දේශපාලන කමිටුව තේරීම, තීරණය කිරීම.

VI. සම්මේලන වාරයන් පවත්වාගෙන යෑමට සභාපති හෝ ලේකම් මණ්ඩලයක් පත් කිරීමට සාමාජිකත්වයට බලය ඇත.

13. දේශපාලන කමිටුව :

I. දේශපාලන කමිටු සාමාජිකත්වය තෝරාගනු ලබන්නේ පක්ෂ සම්මේලනයකදීය. සම්මේලන වාරයකදී දේශපාලන කමිටුවේ සාමාජිකයින් නම් කිරීමේ අයිතිය පවතින දේශපාලන කමිටුවට ඇත .

II. පත් කරන ලද දේශපාලන කමිටුවට ලේකම් මණ්ඩලයක්, පක්ෂ නායක සහ ප්‍රධාන ලේකම් වරයෙක් පත් කිරීමේ අයිතිය පැවරේ.

III. පක්ෂයේ සංවිධාන රටාව තීරණය කිරීමේ බලතල දේශපාලන කමිටුවට ඇත. දිසා සභා සහ වෙනත් ඒකක මාර්ගයේ මෙය ක්‍රියාවට පරිවර්ථණය කිරීමටද මෙයට අයත් වේ.

IV. සම්මේලන වාර දෙකක් අතර ප්‍රධාන අධිකාරිය දේශපාලන කමිටුව වේ.

V. පක්ෂයේ අරමුදල් හා ඊට අදාල වන අය පවත්වාගෙන යාම දේශපාලන කමිටුවේ වගකීමය.

14. පක්ෂ විනය :

I. පක්ෂ විනයේ පදනම විය යුත්තේ පක්ෂ ප්‍රතිපත්ති අරමුණ හා වැඩ පිලිවෙල පිලිගැනීම හා ඒ අනුව කටයුතු කිරීමය.

II. සියලු සාමාජිකයින් පක්ෂයේ කුමන පදවියක සිටියත් එකම විනය මාලාවකට යටත් විය යුතුය .

III. පක්ෂ ව්‍යවස්ථාවට අනුකූලව සියලුම සාමාජිකයින් කටයුතු කළ යුතුය.

IV. පක්ෂයේ සියලු සාමාජිකයින් මධ්‍යගත ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිපත්තීන් අනුව කටයුතු කල යුතුය.

V. පක්ෂය තුළ කණ්ඩායම්වාද ගොඩනැගීම බලවත් විනය විරෝධී ක්‍රියාදාමයකි.

VI. පක්ෂ සාමාජිකයින් සැම විටම කොමියුනිස්ට්වාදීව කටයුතු කල යුතු එසේ කිරීම තුලින් පක්ෂයේ ගෞරවය හා කීර්තිය රැකගත යුතුය.

VII. පක්ෂය විසින් ගනු ලබන තීරණයන් මත සිදුවන වැඩ වර්ජනයන් හෝ එවැනි වෙනයම් ක්‍රියාවක දී එය දියකර හැරීම, ඊට සහභාගිවී සිටින සහෝදරවරුන්ව අධෛර්යමත් කිරීම හෝ ඉන් මග හැරීම කිසි විටෙකත් නොකළ යුතුය.

**විනයානුකූල ක්‍රියාමාර්ගයන් :**

II. විනයානුකූල ක්‍රියාමාර්ගයන් පහත සඳහන් පරිදි වේ.

(1) අවවාද කිරීම

(2) ප්‍රකාශණයන් නිකුත් කිරීම.

(3) පක්ෂයේ පදවියෙන් ඉවත් කිරීම.

(4) පූර්ණ පක්ෂ සාමාජිකත්වය අවුරුද්දකට නොවැඩි කාලයකට තහනම් කිරීම.

(5) පක්ෂයෙන් ඉවත් කිරීම.

II. විනය ක්‍රියාමාර්ගයන් සාමාන්‍ය අවස්ථාවන්හිදී ගත යුත්තේ වෙනත් මාර්ගයන් තුළින් අදාල සහෝදරයා නිවැරදි කිරීමට නොහැකි වීමෙන් අනතුරුවය පමණි. එනමුදු විනය බිඳීයෑම තුලින් පක්ෂයේ හොඳ නමට කැලලක් සිදුවීමට අවකාශයක් ඇති අවස්ථාවන්හිදී ක්ෂණික විනයානුකූල පියවරක් ගත යුතුය.

III. පක්ෂයෙන් ඉවත් කිරීමට බරපතල කම විනයානුකූල ක්‍රියාමාර්ගය වන අතර එය ගත යුත්තේ අදාල ප්‍රශ්ණය ගැඹුරටම අධ්‍යයනය කිරීමෙන් අනතුරුවය.

IV. විනය ප්‍රශ්ණයක් සම්බන්ධයෙන් පරීක්ෂණයට භාජනය වන සහෝදරයෙකුට ඔහුට හෝ ඇයට එල්ලවී ඇති චෝදනා සහ ඊට සම්බන්ධ සියලුම කරුණු දැනුම්දිය යතුය.

V. වැඩ වර්ජන හෝ එවැනි ක්‍රියාමාර්ගයන් බිඳීම, අධික බීමත්කම, පක්ෂ රහස් එළිකිරීම හෝ මුදල් වංචා කිරීම පිළිබඳව පක්ෂය තුල චෝදනා එල්ලවූ අයකුගේ පක්ෂ සාමාජිකත්වය වහා තහනම් කිරීමට සහ එවැන්නකු පක්ෂ නිලයෙන් වහා ඉවත් කිරීමට බලය ඇත.

VI. පක්ෂ සාමාජිකයින් විශේෂයෙන් ජනතාව අතර වැඩ කිරීමේදී අධික ලෙස සුරාපානය කිරීමෙන් වැලකී සිටිය යුතුය.

VII. විනාශකාරී ලෙස තවත් සහෝදරයෙකු විවේචනය නොකල යුතුය.

VIII. පක්ෂයේ මුදල් හා සම්පත් වංචා නොකල යුතු අතර ඒවා වැරදි සහගත ලෙස පරිහරණය නොකළ යුතුය.

IX. නිර්ධන පංති ජාත්‍යන්තරවාදී ප්‍රතිපත්ති මත පිහිටා කටයුතු කළ යුතු අතර ජාති ,කුල ආගම්බේද හා ප්‍රදේශවාදය වැනි දෑ බැහැර කල යුතුය.

X. විනය පරීක්ෂණයකින් දෙනු ලබන තීරණයට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීමේ අයිතිය සෑම විටම අදාල සහෝදරයාට අයත් වේ.

XI. පක්ෂයේ විනය කමිටුව එහි දේශපාලන කමිටුව විසින් පත් කරනු ලැබේ. එහි තීරණයන්ට විරුද්ධව වන අභියාචනයන් පිලිබද තීරණ ගත යුත්තේ දේ,ශපාලන කමිටුව

XII. විශේෂ අවස්ථාවන්හිදී බරපතල පක්ෂ විරෝධී කටයුතු සම්බන්ධයෙන් සාමාජිකයෙකු වහාම ක්‍රියාත්මක වන පරිදි ඉවත් කිරීම දේශපාලන කමිටුවට බලය පැවරේ.

15. ව්‍යවස්ථාව :

I. අතුරු ව්‍යවස්ථා පැනවීමේ බලතල දේශපාලන මණ්ඩලයේ ඒකමතිකත්වය මත පදනම් වේ.

II. ව්‍යවස්ථාව සංශෝධනය කළ හැක්කේ පක්ෂ සම්මේලනයක දී පමණි.

පී. එම්. පොඩිඅප්පුහාමි
පක්ෂ නායක
දේශ විමුක්ති ජනතා පක්ෂය

[illegible] ඩී. කලන්සූරිය
ප්‍රධාන ලේකම්
දේශ විමුක්ති ජනතා පක්ෂය